# HDFC බැංකුව

නවා මූල්‍ය විසඳුම් හරහා ව්‍යාපාරික ප්‍රජාව ඇතුළු සමස්ත ශ්‍රී ලාංකිකයින්ගේ අභිලාෂ ඉටු කර ගැනීම සඳහා දශක තුනකට අධික කාලයක් පුරා දැයට මහඟු සේවයක් ඉටු කරන **HDFC** බැංකුව හා සම්බන්ධ වී ඔබේ වෘත්තීය ජීවිතය ඉදිරියට ගෙන යාමට මහඟු අවස්ථාවක් උදා වී ඇත.

බැංකුකරණ ක්ෂේත්‍රයේ සැබෑ වෙනසක් ඇති කිරීමට **HDFC** බැංකුව සූදානමින් සිටින බැවින් පහත සඳහන් තනතුර සඳහා දක්ෂ, ක්‍රියාශීලී, බැංකුකරණ ක්ෂේත්‍රය පිළිබඳ උනන්දුවක් දක්වන අයදුම්කරුවන්ට අප හා එක් විය හැකිය.

**කළමණාකරු - අභ්‍යන්තර විගණන** - [**ශ්‍රේණිය** III (1)]

**වගකීම්**

- බැංකු ශාඛාද ඇතුළු බැංකුවේ සියලු අංශවලට අදාළ විගණන, විමර්ශන හා වෙනත් පැවරුම් නිසි පරිදි සැළසුම් කිරීම සහ ක්‍රියාවට නැංවීම.
- අවදානම් මත පදනම් වූ විගණන සංකල්ප පිළිබඳව අවබෝධ කර ගැනීම සහ බැංකු ක්ෂේත්‍රයේ පවතින මෙහෙයුම් අවදානම් පිළිබඳ දැනුවත් වීම.
- විගණන කණ්ඩායම කාර්යක්ෂමව මෙහෙයවීම, විගණන ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම, අදාළ කාර්ය නියමිත කාල සීමාව තුළ සම්පූර්ණ කර ඇති බව, විගණන විෂය පථය ප්‍රමාණවත් ලෙස ආවරණය කර ඇති බව සහ අදාළ ක්‍රියාවලියට අනුගත වී ඇති බව සහතික කිරීම.
- විගණන සහ විමර්ශන ස්වාධීනව සම්පූර්ණ කිරීම සහ අදාළ වාර්තා සකස් කිරීම.
- පද්ධති, නිෂ්පාදන හා කාර්ය පටිපාටි සංවර්ධනය සහ ප්‍රධාන අභ්‍යන්තර විගණන නිලධාරී විසින් පවරනු ලබන වෙනත් කාර්ය සහ ව්‍යාපෘති සඳහා ක්‍රියාකාරීව දායක වීම.

**සුදුසුකම්**

- ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ ((ICASL), වරලත් සහතිකලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ (ACCA), සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ (CMA), එක්සත් රාජධානියේ වරලත් කළමනාකරණ ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ (CIMA) සාමාජිකයෙකු වීම.
  හෝ
- පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබා ගත් මූල්‍යකරණය, ගිණුම්කරණය, වාණිජ්‍යය, ව්‍යාපාර කළමනාකරණය, කළමනාකරණය හෝ ආර්ථික විද්‍යාව පිළිබඳ උපාධියක්.
- බැංකුකරණය පිළිබඳ පූර්ණ වෘත්තීය සුදුසුකම් අතිරේක සුදුසුකමක් වනු ඇත.
- මූල්‍ය සේවා ක්ෂේත්‍රයේ කළමනාකරුවෙකු/සහාය කළමනාකරුවෙකු ලෙස වසර 5ක විගණන අත්දැකීම් ලබා තිබීම.
- තොරතුරු තාක්ෂණය පදනම් කර ගත් විගණන පළපුරුද්ද අමතර සුදුසුකමක් වනු ඇත.
- ගිණුම්කරණ හා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන නිර්දේශ, මාර්ගෝපදේශ සහ වෙනත් අනුකූලතා හා නියාමන අවශ්‍යතා පිළිබඳ පුළුල් දැනුමක් තිබීම.
- මූල්‍ය ආයතනයක ආයතනික පරිපාලන පිළිවෙත් පිළිබඳ දැනුම තිබීම.
- විශ්ලේෂණය කිරීමේ, අර්ථ නිරූපණය කිරීමේ සහ ලිවීමේ විශිෂ්ට හැකියාවක් තිබීම.

**වයස් සීමාව**

- අවුරුදු 45ට අඩු වීම වඩාත් සුදුසු වේ.

සිත් ගන්නා වැටුප් සහ දීමනා හිමි වේ.

**අයදුම් කිරීමේ ක්‍රියාපටිපාටිය**

- විද්‍යුත් පණිවිඩයේ විෂය තීරයෙහි (**Subject**) ඉල්ලුම් කරන තනතුර සඳහන් කරමින් 06.12.2023 දින හෝ එදිනට පෙර තමා පිළිබඳ විස්තර ලබා ගත හැකි ඥාතීන් නොවන දෙදෙනෙකුද සඳහන් කරමින් ඔබගේ ඉල්ලුම් පත්‍රය careers@hdfc.lk යන විද්‍යුත් ලිපිනය වෙත යොමු කළ යුතුය.


HDFC බැංකුව
ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත
තැපැල් පෙට්ටිය 2085
කොළඹ 02
දුරකථනය : 0112356800